# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 මැයි

මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ මනෝවිද්‍යාව

**බෞද්ධ ව්‍යවහාරික මනෝවිද්‍යාව හා බෞද්ධ ප්‍රජානන මනෝවිද්‍යාව BUPS – 28224**

යටත් පිරිසෙයින් එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින් ඇතුළත් වන සේ තෝරාගත් ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

<u>1 කොටස</u>

01. කායික, මානසික සාමාජීය හා ආධ්‍යාත්මික යහපැවැත්ම පවත්වාගෙන යාම සඳහා ආර්යෂ්ඨාංගික මාර්ගය අදාළ කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

02. මානව වර්ගයාගේ ඒකත්වය බුද්ධ දේශනාවන් තුළ විග්‍රහ වී ඇති අයුරු මූලාශ්‍රයානුසාරයෙන් පෙන්වා දෙන්න.

03. සංතෘෂ්ටිය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්හි අන්තර්ගත මනෝවිද්‍යාත්මක අගය අනාවරණය කරන්න.

04. බෞද්ධ භාවනා ක්‍රමයන්හි පවතින මනෝචිකිත්සාමය වැදගත්කම පැහැදිලි කරන්න.

05. "වර්තමාන සමාජයෙහි උද්ගත වී ඇති විවිධ සංකීර්ණතාවලට ප්‍රමුඛ හේතුව වන්නේ හේතුඵල සම්බන්ධතාව පිළිබඳ පුද්ගලයාට මනා වැටහීමක් නොමැතිකමයි." බෞද්ධ හේතුඵල සිද්ධාන්තය ඇසුරින් ඉහත ප්‍රකාශය තහවුරු කරන්න.

<u>**II කොටස**</u>

06. මනසෙහි ව්‍යුහය සහ මානසික ක්‍රියාකාරීත්වය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් පරීක්ෂා කරන්න.

07. පුද්ගල සංජානන ක්‍රියාවලිය ව්‍යවහාරික ලෝකය තුළ මානව පැවැත්ම යාවත්කාලීන කිරීම සඳහා ඉවහල් වන ආකාරය ගෙනහැර දක්වන්න.

08. ප්‍රපඤ්ච ගොඩනැගෙන ආකාරය පැහැදිලි කොට ඒවා සහ මතකය අතර පවත්නා අන්තර් සම්බන්ධතාව බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් පැහැදිලි කරන්න.

09. භාෂාව හේතුවෙන් නිර්මාණය වන ගැටුම්, නිරාකරණය කිරීම සඳහා භාෂා භාවිතය පිළිබඳ බෞද්ධ නිර්ණායක හේතු වන ආකාරය සාකච්ඡා කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකකට (02) පමණක් කෙටි සටහන් සපයන්න.

| | | | |
|---|---|---|---|
| I | විඤ්ඤාණ | II | සඤ්ඤා |
| III | වේදනා | IV | මනසිකාර |

*********************************